දැහැමිය.
එදා ධාතුසේන රජතුමා තමාගේ ධනය ලෙස පෙන්වා දුන්නේ කලාවැවේ ජල සම්පතයි. අද බිහිවන පරම්පරාගත නායකයන්ට හා ඔවුන් වටා සිටින පුරෝහිතයන්ට පෙන්වා දීමට බොහෝ දෑ ඇත. එහෙත් ඔවුනට ඒවා පෙන්වා දීමට නොහැකි වුවත් ජනතාවගේ ඡන්දය ලැබෙන බව දනිති. එපාවූ දවසට වෙනෙකකු පත් කරගත්තද ඔවුන්ද පසුව විශාල ධනයකට හිමිකම් කියන බව ජනතාව දනිති. පීඩනය තමා පසුපස හමාඑන විට ජනතාවට ඇත්තේ දැඩි හිරුඑළියත්, සුළං රැල්ලත් පමණි. එවැනි කාලයට මඩ වතුර වුවද පිරිත් පැන් කර විකිණිය හැක. දූවරු සිටින පියවරුන් අසරණ දරු-වන් දූෂණය කරන්නේ මේ නීතියේම වරදින් බව රජය දනියි. මව් කිරි බී හැදුණු වැඩුණු එවුන් එවැනි මල් තලා දමා අසරණ කරන විට නීතියද අසරණ කරන්නේ පවතින දේශපාලනයයි.

එදා සිට අද දක්වා අල්ලස් දූෂණ වංචා ඉහ වහා ගොස් ඇත්තේ මහා පරිමාණයෙනි. දේශපාලකයන් කෝටි ගණන් ගිල ගනිද්දී, රටේ ජනතාව පාරක් හදන්නට ගෙනත් දමනා වැලි ඇටයක් කළුගල් බෑගයක් හොරකම් කරන තැනට පත්ව සිටිති.

අධ්‍යාත්මය, ශ්‍රේෂ්ඨත්වය යට ගොස් "මුදල" නැමැති සාධකය ජනතාවට මුලින්ම ඉස්මතු කර පෙන්වා ඇත්තේ පාලකයන්ය. එවැනි දේශපාලකයන් සදාචාරය ගැන කතා කරති.

අල්ලසට දූෂණයට, වංචාවට හසුවී ඇති ඇමතිවරුන් සිටින ඇමති මණ්ඩලයේ සමහර සාමාජිකයන් සමඟ රටේ නායකයා පිළිසඳරේ යෙදෙමින් තේ පැන් බොන්නේ ජනතාවද සමඟ සිනාසෙමිනි. එදා කොටි ගම්මානයකට ගසා සිය ගණනක් විනාශ කළ දිනයේ අඬා වැටෙන දෙමව්පියන් හමුවේ එල්ටීටීය විනාශ කරන බවට ප්‍රතිඥා දුන් ජනාධිපතිවරයා අද තමන්ගේම දේශපාලකයන්ගේ අමනකම් හමුවේ නිහඬ පිළිවෙතක් අනුගමනය කරන්නේ කුමකටදැයි ජනතාව අසන යුගය පැමිණ ඇත. එහෙත් එයට පිළිතුරු දෙන කාලය අපරටේ විපක්ෂය විසින් නිශ්ක්‍රිය කර ඇත. එහෙව් යුගයක අප තවමත් දුටුගැමුණු රජුගේ කඩුව සොයමින් ඇවිදියි. කුස රජුගේ ආලයටත් විජය කුවේණි පෙම් පුවතටත් නව අර්ථ කථන ලබාදෙමින් සිටියි.





